# 5 ජොහන් ශුභාරංචිය

කර්තෘ : ශුද්ධ වූ ජොහන් අපෝස්තුලුතුමා

කාලය : ක්‍රි.ව. 90 - 100

අරමුණු : - ජේසුස් වහන්සේ දෙවියන් වහන්සේගේ පුත්‍රයා බවත් උන්වහන්සේ අදහා ගැනීමෙන් සදතන ජීවිතය ලැබෙන බවත් ඉගැන්වීමට ය.

ශුභාරංචිය සඳහා භාවිත වන වෙනත් නම් : ආධ්‍යාත්මික ශුභාරංචිය



5.1 රූපය - ශුද්ධ වූ ජොහන් තුමා

## "මම වෙමි" ප්‍රකාශන

ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ දේවත්වය ප්‍රකාශ වන "මම වෙමි" ප්‍රකාශ හතක් මෙම ශුභාරංචියෙහි ඇත.

### 1. "ජීවනදායක භෝජනය මම වෙමි" (ජොහන් 6:35)

සදාතන ජීවිතය ලබා දෙන සැබෑ ආහාරය ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ය. උන්වහන්සේ දිව්‍ය සත්ප්‍රසාදය තුළ ජීවමාන ව වැඩ සිටින සේක. අපි දිව්‍ය සත්ප්‍රසාදය ලබා ගත යුත්තේ මහත් ගෞරවයෙන් හා ආදරයෙන් යුක්ත ව ය. දිව්‍ය සත්ප්‍රසාදය නිතර ලබා ගැනීමෙන් අපගේ ජීවිත ආධ්‍යාත්මික ව පෝෂණය වෙයි.

### 2. "ලෝකයේ ආලෝකය මම වෙමි" (ජොහන් 8:12)

ජේසුස් වහන්සේ සෑම කෙනෙකුට ම ආලෝකයක් වූ ආකාරය මෙම ශුභාරංචිය තුළින් පැහැදිලි වේ. වචනයෙන් පමණක් නොව ක්‍රියාවෙන් හා පැවැත්මෙන් ජේසුස් වහන්සේ ලෝකයට ආලෝකයක් විය. ආලෝකය ඇති තැන අන්ධකාරයට ඉඩක් නැත. ආලෝකයෙහි ජීවත් වීමට සියලු ම පාපිකාරී ක්‍රියාවන්ගෙන් ඈත්විය යුතු වෙයි. අපි ආලෝකයේ දරුවන් වීමට උත්සාහ කරමු.



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

### 3. "බැටළුවන්ට දොරටුව මම වෙමි" (ජොහන් 10:7)

ජේසුස් වහන්සේ නමැති එඬේරාණන්ගේ බැටළුවන් වන අපි ඔවුන් වහන්සේ නමැති දොරටුවෙන් ඇතුළු වී සදාතන ජීවිතය ලබා ගත යුතු වෙමු.

### 4. "මම යහපත් එඬේරා වෙමි" (ජොහන් 10:11)

බැටළු එඬේරෙකු බැටළුවන් මෙහෙය වන්නේ ඉදිරියෙන් ගමන් කරමිනි. එඬේරෙක් එසේ කරනුයේ බැටළුවන්ට අවැසි ආරක්ෂාව හා මඟපෙන්වීම තහවුරු කරනු සඳහා ය. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ යහපත් එඬේරෙක් ලෙස අපට මඟපෙන්වීම ලබා දෙයි. අපි උන්වහන් සේට කීකරු යහපත් බැටළුවන් වෙමු.



5.2 රූපය - යහපත් එඬේරා

### 5. "පුනර්ජීවනය ද ජීවනය ද මම වෙමි" (ජොහන් 11:25)

ජේසුස් වහන්සේ අපට ජීවිතය ලබා දෙනවා පමණක් නොව මරණයෙන් පරාජය කළ නොහැකි ජීවිතයකට අප පංගුකාර කරන සේක. උන්වහන්සේ මරණය පරාජය කොට උත්ථාන වූවා සේ අප ද උත්ථාන කරනු ලබන සේක. මරණින් පසු අපට ලැබෙන ජීවිතය පිළිබඳ ව විශ්වාස කරමින් එම ජීවිතය ලබා ගනු සඳහා යහපත් ව ජීවත් විය යුතු වෙමු.



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

## 6. “මාර්ගය ද සත්‍යය ද ජීවනය ද මම වෙමි” (ජොහන් 14:6)

මාර්ගය පෙන්විය හැක්කේ, සත්‍යය ප්‍රකාශ කළ හැක්කේ හා ජීවිතය දිය හැක්කේ ඒවා ඇති කෙනෙකුට පමණි. දෙවියන් වහන්සේ වෙතට යන මාර්ගය ජේසුස් වහන්සේ දන්නා සේක. උන්වහන්සේ සත්‍යය වන සේක. උන්වහන්සේ විශ්වාස කිරීමෙන් අපට සදාතන ජීවිතය ලබා ගත හැකි ය. අපි උන්වහන්සේ පෙන්වා දුන් ධර්ම මාර්ගයේ ගමන් කරමින් සත්‍යයට සාක්ෂි දරමු.

## 7. “සැබෑ මිදිවැල මම වෙමි” (ජොහන් 15:1)

මිදි අතුවල ඵල දරන්නට නම් ඊට අවශ්‍ය ජලය හා පෝෂණය මිදි වැලෙන් ලබා ගත යුතු වෙයි. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ සැබෑ මිදි වැල ය. අපගේ ජීවිත සාර්ථක ව ඵල දැරීමට ජේසුස් වහන්සේ නමැති මිදිවැලට සම්බන්ධ විය යුතු වෙමු. ජේසුස් වහන්සේ නමැති මිදිවැලේ ඵල දරන අතු අපි වෙමු.

### ක්‍රියාකාරකම



1. ජොහන් ශුභාරංචිය ලියූ අරමුණු **දෙකක්** ලියන්න.
2. හතරවෙනි ශුභාරංචියෙහි සඳහන් “මම වෙමි” ප්‍රකාශ **තුනක්** නම් කරන්න.
3. “මම යහපත් එඬේරා වෙමි” ජේසුස් වහන්සේගේ මෙම ප්‍රකාශය පිළිබඳ ව ඔබගේ අත්දැකීම් ද කැටි කොට වාක්‍ය **දහයක්** ලියන්න.

**ජීවිතයට බිඳක්**

*යහපත් බැටළු එඬේරාගේ යහපත් බැටළුවන් වීමට වෙර දරමු.*



නොමිලේ බෙදාහැරීම සඳහා ය.